
# කහ කුරුලු පවුල



ගිහංගා සුමින්දි ද සිල්වා

# කහ කුරුලු පවුල

**කතෘ**

**ගිහංගා සුමින්දි ද සිල්වා**

**චිත්‍ර සහ කෘතියේ අයිතිය - ගිහංගා සුමින්දි ද සිල්වා**

**ISBN – 978-624-206-934-0**

**දිනය - 15.11.2023**

**කතෘගේ වෙනත් කෘති - The Girl and Puppy**
**The Gift**

# පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් කල

මාගේ ආදරණීය

අම්මාට, තාත්තාට සහ නිරතුරුවම මා දිරිමත් කරමින්

යහමග පෙන්වන

මාගේ ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා ගෞරවයෙන් පුදමි.

***මේ පොත සැදීමට මා හට***

***උදව් උපකාර කළ සියලු දෙනාටම***

***ස්තුතියි.***

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්ත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනා කරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01


එකමත් එක කාලෙක කැලේක කහ කුරුලු පවුලක් ජීවත් වුණා.



ඒ පවුලේ අම්මයි තාත්තයි පුංචි කහ කුරුලු පැටව් දෙන්නෙකුයි හිටියා.

ටික කාලයකින් මේ කහ කුරුලු පවුලේ වැඩිමහල් කහ කුරුලු පැටියා පවුලෙන් වෙන් වී ගියා.






පුංචි කුරුලු පැටියා තාත්තාගෙන් ඇහුවා “ ඇයි අයියා යන්න ගියේ කියලා ” එතකොට තාත්තා කිව්වා “ පුතේ අයියා දැන් ලොකුයිනේ එයා අවට ලෝකය ගැන දැන ගන්න ඕනේ ඒ හින්දා අයියා කුරුලු කූඩුවෙන් යන්නම ඕන කියලා ”.

එයාගෙ අයියා ගිය නිසා කහ කුරුලු පැටියාට ගොඩක් දුක හිතුනා.




“ඒ කියන්නේ මමත් යන්න ඕනෙ ද? ” කියලා කහ කුරුලු පැටියා අම්මගෙන් ඇහුවා. “ඔව් පුතේ ඔයාටත් ලොකු උනාම යන්න වෙනවා” කියලා අම්මා කිව්වා.

ටික කාලයක් ගියාට පස්සේ කහ කුරුලු පැටියාටත් යන්න කාලේ හරි කියලා තාත්තා කිව්වා.




කහ කුරුලු පැටියාත් ඉතාමත් දුකින් එයාගේ දෙමව්පියන් දාලා යන්න ගියා.


කහ කුරුලු පැටියා තනිවම කැලේ ඇතුලටම පියඹා ගෙන ගියා. කැලේ ඇතුලට යන විට කුරුලු පැටියාට පාලුවක් දැනුණා. එයා දැන් තනිවම තමන්ට ඕන ආහාර හොයා ගත්තා.




ටිකෙන් ටික කහ කුරුලු පැටියා කැලේ ජීවත් වෙන්න පුරුදු වුණා.




කාලයක් ගියාට පස්සේ කහ කුරුලු පැටියාට එයාගේ අයියා හමු වුණා. කහ කුරුලු පැටියාට හරිම සතුටුයි.





“ අපි දෙන්නා අපේ අම්මයි තාත්තයි බලන්න යමු ”
කහ කුරුලු අයියා කීවා. ඊට සතුටු වූ කහ කුරුලු
පැටියා අයියත් එක්ක එයාලගෙ දෙමව්පියන් බලන්න
ගියා.

කහ කුරුලු අම්මටයි තාත්තටයි හරිම සතුටුයි එයාලගේ දරුවෝ දෙන්නා ආ එකට “ අපි දැන් වයසයිනේ ” කහ කුරුලු තාත්තා කීවා. “ අපි හැමදාම අපේ අම්මයි තාත්තයි බලා ගන්නවා ” කහ කුරුලු පුතාලා දෙන්නා එක හඬින් කීවා.



කහ කුරුලු පවුල ආයෙමත් සතුටින් ජීවත් වුණා.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩීම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත් ත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිමාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01